**වෙරුගල් ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 11 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 දෙසැම්බර් 08 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වෙරුගල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව්කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ලෙජරය අනුව ගෙවන ලද අත්තිකාරම්වල ශේෂය 2015 දෙසැම්බර් 31 දිනට රු. 850,519 ක් වූවද එම දිනයට ශේෂ පත්‍රයේ මෙම ශේෂය රු. 1,296,689 ක් ලෙස පෙන්වා තිබීමෙන් ලබාදුන් අත්තිකාරම් රු. 446,170 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ වාහන බැටරි, ටියුබ් සහ ටයර් යන භාණ්ඩ රු. 178,870 ක් ලෙස ප්‍රාග්ධන වැයක් වශයෙන් යන්ත්‍ර යන්ත්‍රෝපකරණ ගිණුම යටතේ දක්වා තිබීමෙන් එම ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු. 198,099 ක් වටිනා ඇණ, බල්බ්, කතුරු සහ PVC නල යන එදිනෙදා පාවිච්චි කරන භාණ්ඩ ප්‍රාග්ධන වියදම් වශයෙන් ගිණුම් ගත කිරීම නිසා ප්‍රාග්ධන වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලෙජරය අනුව හිඟ කඩකුලි ප්‍රමාණය 2015 දෙසැම්බර් 31 දිනට රු. 254,820 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල හිඟ කඩකුලි රු. 62,150 ලෙස ගිණුම්ගත කිරීමෙන් කඩකුලී රු. 192,670 කින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.3 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

-----------------------------------

එකතුව රු. 47,495 ක් වූ විවිධ ණයහිමි ශේෂ 04 ක් ගෙවා නිම නොකර වරෂ 08 ක් පමණ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ පහත දක්වෙන එක් එක් විෂයයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණන සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයයන් | වටිනාකම් | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ණය ගැතියන් | 1,908,759 | ණය ගැති ලේඛන |
| ණය හිමියන් | 1,481,683 | ණය හිමි ලේඛන |
| ආයෝජන | 233,820 | විස්තරාත්මක උප ලේඛනය |

### 1.3.5 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | |
| (i) පරිච්ඡේදය 1 රීති 5(12) | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් කිරීම් නිලධාරින් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුණද ඒ අයගෙන් ආරක්ෂක ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | පරිච්ඡේදය X රීති 193 | වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ විස්තර අයවැය ඇස්තමේන්තු සමඟ සසඳා විචලනයන් සඳහා හේතුන් ඇතුලත් ප්‍රකාශයයක් සකස්කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් කොන්ත්‍රාත් තැන්පත්, රඳවා ගැනීම් සහ විවිධ තැන්පත් රු. 277,265 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | පළාත් මූල්‍ය රීති අංක 432.2, 432.3 | සභාව විසින් ප්‍රයෝජනට ගන්නා වාහන 03 ක් සම්බන්ධයෙන් ධාවන සටහන් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ 04/2015 | රජයේ ආයතනවල මෝටර් වාහන රක්ෂණ ආවරණ රක්ෂණ නියෝජිතයන් මාර්ගයෙන් ලබානොගතයුතු බව සඳහන්වුවද සභාව සතු වාහන දෙකක රු. 82,467 ක් වූ රක්ෂණ ආවරණ රක්ෂණ නියෝජිතයෙක් මගින් ලබාගෙන තිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ මෙහෙයුම්වලින් රු. 2,731,376 ක් පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායමක් ලබා තිබූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වලින් රු. 792,361 ක ආදායම් ඉක්මවූ වියදමක් වී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විස්තර | ඇස්තමේන්තුගත ආදායම් | තත්‍ය ආදායම් | 2015 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|
| -------------- | ---------------- | ------------ | --------------- |
| | රු. '000 | රු. '000 | රු. '000 |
| කඩකුලි | 837 | 293 | 865 |

| | | | |
|---|---|---|---|
| සේවා සඳහා ගාස්තු | 111 | 176 | -- |
| බලපත්‍ර ගාස්තු | 393 | 554 | -- |

**2.2.2 මුද්දර ගාස්තු**

**--------------**

2013 දෙසැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මුද්දර ගාස්තු ගණනය කර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 වරිපනම් සහ බදු**

**-------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් නිලාවෙලි සහ කුච්චවෙලි යන ප්‍රදේශවල තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි වලින් වරිපනම් අයකර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමෙන්තුව ලවා වාර්ෂික වටිනාකම් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචිතය**

**----------------------------**

**3.1 කළමනාකරණ දූර්වලතා**

**---------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වාහන 06 ක් වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට ධාවනයේ යොදවා තිබූ නමුත් සභාවේ නමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය අනුව සියලු රාජ්‍ය ආයතනවල පැමිණීම් සටහන් කිරීම සඳහා වේලාව සටහන් යන්ත්‍ර සවිකළ යුතු වුවද, සභාව විසින් වේලාව සටහන් යන්ත්‍ර සවිකර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සභාවේ සේවකයන්ට සහ වෙනත් ආයතනවලට ගෙවා තිබූ රු. 1,296,689 ක අත්තිකාරම් සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 163.3 අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2015 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙන් පෙන්වා දුන් පුස්තකාල පොත් 262 ක ඌණතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රිය වත්කම්**

**------------------**

සභාව සතු රු. 2,273,800 වටිනා කාමර 07 කින් යුතු කඩ කාමර සංකීර්ණය 2011 වර්ෂය සිට සමාලෝචිත වර්ෂය අවසාන දක්වා බදු දීමට කටයුතු කර නොතිබුණි.

## 4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

2015 දෙසැම්බර් 31 දිනටවූ අනුමත සේවක සංඛ්‍යාව සහ තත්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාය | තත්‍ය සේවක සංඛ්‍යාය | පුරප්පාඩු සංඛ්‍යාය |
|---|---|---|---|
| විධායක | 01 | 01 | - |
| සහායක | 15 | 12 | 03 |
| සුළු සේවක | 30 | 13 | 17 |
| එකතුව | 46 | 26 | 20 |

කළමනාකරණ සේවා තනතුරු 03 ක් පසුගිය වසර 06 කාලයක සිට පුරප්පාඩුව පැවතියද එය පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 5 පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරවනු ලැබේ.

| පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ලෙජරය යාවත් කාලීනව පවත්වා නොතිබුණි.<br>ii. වත්කම් වියදම් වල ස්වභාවය අනුව වර්ගීකරණය කර නොතිබුණි. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | i. ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි.<br>ii. ගබඩා ලෙජරය නිසි ලෙස පවත්වා නොතිබුණි. |
| (ඇ) ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |